මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்வி வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்வி வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2020 මාර්තු

| බෞද්ධ ශිෂ්ටාචාරය I | 12 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

**සැලකිය යුතුයි**

- ❖ **සියලු ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- ❖ **ප්‍රශ්න අංක 01-50 දක්වා එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරු වලින් වඩාත් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුරු තෝරා එය ලකුණු කරන්න.**

---

01) බුදු රජාණන් වහන්සේ ලොව පහළ වූ යුගයේ ඉන්දීය ජනතාව අතර බෙහෙවින් ප්‍රචලිතව පැවති දහම වූයේ,

I. බ්‍රාහ්මණ ධර්මය යි III. ජටිල ආගමයි
II. උපනිෂද් දර්ශනයයි IV. බහුදේව වාදයයි
V. පුබ්බේකත හේතු වාදයයි

02) දීඝ නිකායේ බ්‍රහ්මජාල සූත්‍රයට අනුව මහා බ්‍රහ්මයා හඳුන්වන ලද විශේෂ නාම ගණයට අයත් නොවන නමකි.

I. සර්වඥයා II. සර්ව දර්ශීයය III. සර්වතෝභද්‍රය IV. සර්වඥතාඥානය
V. සර්ව ව්‍යාපීයය

03) මිනිසාගේ මැවීම සිදුව ඇත්තේ මහා බ්‍රහ්මයාගේ ශරීරයේ විවිධ ස්ථානවලිනි.ඒ අනුව මහා බ්‍රහ්මයාගේ කළවා යුගලයෙන් මවන ලද්දේ,

I. බ්‍රාහ්මණ සමාජයයි II. ක්ෂත්‍රිය සමාජයයි III. වෛශ්‍ය සමාජයයි
IV. ක්ෂුද්‍ර සමාජයයි V. පංචම කුලයයි

04) යාගයකදී දෙවියන් සතුටුවන ලෙසින් වේද පාඨ ගායනා කරන පූජකයා හඳුන්වන නාමය වන්නේ,

I. හෝතෘ ලෙසය II. අටවයුව ලෙසය III. යඥ කාරක ලෙසය
IV. පූජක ලෙසය V. උද්ඝාතෘ ලෙසය

05) බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට අනුව ස්වාමියාගේ මරණින් පසු ඔහු දවන සෑයටම පැන දිවි නසා ගත යුතුය. මෙම චාරිත්‍රය හඳුන්වන නාමය වන්නේ,

I. සති පූජාව වශයෙනි II. උපනයන චාරිත්‍රය වශයෙනි III. ගෘහීය චාරිත්‍ර වශයෙනි
IV. පර්ධා චාරිත්‍රය වශයෙනි V. ශ්‍රාද්ධ වශයෙනි

06) තමන් කෙලෙස් ගැටවලින් තොරයැයි කියා හඳුන්වාගත් ශාස්තෲවරුන් සිටි අතර ඔවුන් හැඳින්වූ නාමය වන්නේ,

I. ජටිල ලෙසය II. ආජීවක ලෙසය III. නිගන්ඨ ලෙසය
IV. පරිබ්‍රාජක ලෙසය V. ශ්‍රමණ ලෙසය

07) බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායේ සුවිශේෂී ලක්ෂණයක් නම්,

I. සන්සුන් ඉඳුරන් ඇති පිරිසිඳු කසාවත් දැරීමයි
II. සංකීර්ණ දිවි පෙවෙතක් ගත කිරීමයි
III. ශරීරයට අධික දුක් දීමයි
IV. ශරීරයට අධික සැප දීමයි V. තමන් කෙලෙස් ගැටළු වලින් තොර සාධුවරුන් වීමයි

08) ෂට් ශාස්තෘවරුන් අතරින් පූර්ණ කස්සප ශාස්තෘවරයාගේ ප්‍රධානතම ඉගැන්වීම වූයේ,

I. ශාස්වත වාදයයි II. අකිරිය වාදයයි III. නිර්මාණ වාදයි

IV. ආත්ම වාදයයි V. අමරා වික්ෂේප වාදයයි

09) සාමඤ්ඤඵල සූත්‍රයේ සඳහන් වන ආකාරයට සප්ත පදාර්ථ වාදය පිළිබඳ ඉගැන්වීමක් කළ ශාස්තෘවරයා වන්නේ,

I. ජෛන මහා වීරතුමාය II. මක්කලී ගෝසාල III. අජිත කේසකම්බලීය

IV. පකුධ කච්ඡායනය V. පූර්ණ කස්සපය

10) ශ්‍රමණ සම්ප්‍රදාය නියෝජනය කළ ආගමික කණ්ඩායම් පමණක් දැක්වෙන පිළිතුර වන්නේ,

I. ජටිල ,නිගන්ඨ,බ්‍රාහ්මණ ය II. ඊශ්වර,තාපස,ආජීවක ය III. බ්‍රාහ්මණ,ආචේලක,සචේලක ය

III. තාපස,ආජීවක,අචේලක ය V. පරිබ්‍රාජක,බ්‍රාහ්මණ,ජටිල ය

11) ශ්‍රමණ සම්ප්‍රදාය ,බ්‍රාහ්මණ සම්ප්‍රදායෙන් වෙනස් වන මූලික ලක්ෂණය වන්නේ,

I. ඥාන මාර්ගය පිළිගැනීම ය II. අනීශ්වර වාදය නොපිළිගැනීම ය

III. අනගාරික ප්‍රතිපදාව නොපිළිගැනීම ය IV. අත්තකිල මතානුයෝගය නොපිළිගැනීම ය

V. ශුද්ධ වූ ආගමික ග්‍රන්ථ නොපිළිගැනීමය

12) අහේතු අප්පච්චවාදී දර්ශනය ඉදිරිපත් කළ ශාස්තෘවරුන් අතර ප්‍රමුඛ වන්නේ,

I. ජෛනයන්ය II. පරිබ්‍රාජකයන්ය III. ආජීවකයන්ය

IV. තාපසයන්ය V. ජටිලයන්ය

13) නිගන්ඨනාථ පුත්ත ශාස්තෘවරයාගේ ඉගැන්වීමක් නොවන්නේ,

I. චතුයාම සංවරයයි II. හේතුඵල වාදයයි III. පුබ්බේකත හේතුවාදයයි

IV. කාය දණ්ඩවාදයයි V. ආත්මවාදයයි

14) සොළොස් මහා ජනපද අතරින් රාජාණ්ඩු පාලන ක්‍රමය පැවති රාජ්‍යයන් පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

I. මගධ,අංග,කෝසල,අවන්ති II. අංග,කෝසල,අවන්ති,පංචාල

III. අංග,මගධ,කාසි,අවන්ති IV. මගධ,කෝසල,වත්ස්‍ය,අවන්ති

V. මගධ,කෝසල,අවන්ති,කුරු

15) සමූහාණ්ඩු පාලන ක්‍රමයක ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,

I. ව්‍යවස්ථාදායකය,විධායක,අධිකරණ යන ත්‍රිවිධ බලතල බෙදී තිබීමයි

II. ව්‍යවස්ථාදායකය,විධායකය, බලතල,එක් පුද්ගලයෙකු සතුව තිබීමයි

III. විධායකය, අධිකරණ,බලතල එක් පුද්ගලයෙකු සතු වීමයි

IV. ප්‍රාදේශීය පාලකයින් සිටීමයි

V. ව්‍යවස්ථාදායක,විධායක,අධිකරණ බලතල එක් පුද්ගලයෙකු සතු වීමයි

16) වේභාර,වේපුල්ල,ගිජ්ජකූට,ඉසිගිලි,පාණ්ඩව යන පර්වත පහකින් වට වී තිබුණු රාජ්‍ය වන්නේ,

I. කෝසල රාජ්‍යයයි II. වජ්ජි රාජ්‍යයයි III. මගධ රාජ්‍යයි

IV. අවන්ති රාජ්‍යයි V. මල්ල රාජ්‍යයයි

17) බුදු රජාණන් වහන්සේ සමග සමීප ඇසුරක් පවත්වා ගනිමින් ඥාතිත්වයක් ගොඩනගා ගැනීමට යොමු වූ පාලකයෙකි.

I. කොසොල් රජතුමා II. අජාසත්ත රජතුමා III. බිම්බිසාර රජතුමා

IV. උදේනි රජතුමා V. පුක්කුසාතී රජතුමා

18) බුදුරජාණන් වහන්සේ විනය නීතිරීති පැනවීමේදී උපෝසත කර්මය අනුදැන වදාළේ කාගේ ඉල්ලීම පරිදි ද?

I. කොසොල් රජතුමාගේ ඉල්ලීම පිරිදි ය II. වජ්ජී රජ දරුවන්ගේ ඉල්ලීම පිරිදි ය

III. බිම්බිසාර රජුගේ ඉල්ලීම පරිදිය IV. අනේපිඩු සිටුතුමාගේ ඉල්ලීම පිරිදි ය

V. විශාඛා මහෝපාසිකාවගේ ඉල්ලීම පරිදි ය

19) ක්‍රි.පූ.6 වන සියවසේ භාරතීය සමාජයේ ධනෝපායනයේදී වැඩිම දායකත්වයක් දක්වන ලද කර්මාන්තය වන්නේ,

I. සත්ව පාලනයයි II. කෘෂි කර්මාන්තයයි III. ගෘහස්ත කර්මාන්තයයි

IV. වෙළඳාමයි V. රාජ්‍ය සේවයයි

20) වාණිජකරණය හා නාගරිකකරණයේදී මහ නගර ගණයට අයත් නොවූ නගරය වන්නේ,

I. රජගහ නුවර ය II. සාකේත නුවර ය III. බරණැස් නුවර ය

IV. කොසඹෑ නුවර ය V. චම්පා නුවර ය

21) බුදු දහමේ සඳහන් සංකල්පයට අනුව කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවීන්ට රාජ්‍ය අනුග්‍රහය ලබාදිය යුතු යැයි දේශනාකොට වදාළ සූත්‍රය වන්නේ,

I. කූටදත්ත සූත්‍රයයි II. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි III. චක්කවත්ති සීහනාද සූත්‍රයයි

IV. අග්ගඤ්ඤ සූත්‍රයයි V. මංගල සූත්‍රයයි

22) වෙළඳාමින් විශාල ධනයක් උපදවාගත් අය හැඳින්වූ විශේෂ නාමය වන්නේ,

I. රජවරු ලෙසය II. සිටුවරු ලෙසය III. ගෘහපතියන් ලෙසය

IV. නාගරිකයින් ලෙසය V. ගම්පතියන් ලෙසය

23) "බුදු සමය අවධාරණය කරනුයේ ධාර්මික වෙළඳාම් කටයුතු වල නිරතවිය යුතු අතර වංචනික ක්‍රියාවලින් වැළකිය යුතු බවයි" මින් අදහස් වන්නේ

I. පංචවිධ අධාර්මික වෙළඳාමින් වැළකිය යුතු බවයි

II. වෙළඳාමින් මුදල් ඉපයීම අනුමත නොකරන බවයි

III. ලාභ ලැබීමේ පරමාර්ථයෙන් වෙළඳාම් කළ යුතු බවයි

IV. වෙළඳාම ධාර්මිකව කළ යුතු බවයි

24) "ඵුට්ඨස්ස ලොක් ධම්මේහි චිත්තං යස්ස න කම්පති" යන ගාථා පාඨයෙන් ප්‍රකට වන බුද්ධ චරිතයේ විශිෂ්ඨ ගුණය හැඳින්වෙන්නේ

I. අරහං ගුණය ලෙසය II. ලෝකවිදූ ගුණය ලෙසය III. තාදී ගුණය ලෙසය

IV. යථාවාදී තථාකාරීගුණය ලෙසය V. පුරිසධම්ම සාරථී ගුණය ලෙසය

25) බුදුරජාණන් වහන්සේගේ අෂ්ට විද්‍යා ඥාණයන්ට අයත් දිබ්බචක්ඛු ඥානය ලෙස හැඳින්වෙන්නේ

I. සත්වයින්ගේ චුතිය හා උත්පත්තිය දැනගැනීමේ ඥානයයි

II. පෙර ආත්මභාව පිළිබඳ දැනගැනීමේ ඥානයයි

III. ලෝකයේ යථාර්ථය දැනගැනීමේ ඥානයයි

IV. දෙවියන්ගේ සිත්වල ඇතිදේ දැනගැනීමේ ඥානයයි

V. මිනිසුන්ගේ සිත්වල ඇති දේ දැනගැනීමේ ඥානයයි

26) බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී බුදුගුණ අතර අෂ්ඨ විද්‍යාවෙන් හා පසලොස් චරණ ධර්මයන්ගෙන් යුක්ත වූ බුදුගුණය වන්නේ

I. සම්මා සම්බුද්ධ ගුණයයි II. ලෝකවිදූ ගුණයයි III. සුගත නම් වූ ගුණයයි

IV. විජ්ජාචරණ සම්පන්න වූ ගුණයයි V. පුරුසධම්ම සාරථී ගුණයයි

27) සුනීත,සෝපාක,රජ්ජුමාලා,කිසාගෝතමී යනාදීන්ට බුදුරජාණන් වහන්සේ පිහිටවීම තුළින් පෙන්නුම් කරන ලද්දේ උන්වහන්සේගේ

I. තාදී ගුණයයි II. අසරණ සරණ ගුණයයි III. මහා කරුණා ගුණයයි

IV. මහා ප්‍රඥාගුණයයි V. ලෝක විදූ ගුණයයි

28) ආදර්ශමත් නායකයෙකු සතු ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

I. අගතිගාමී නොවීම,මැදිහත් පිළිවෙත් අනුගමනය කිරීම,උපාය කුසලතාවයෙන් යුක්තවීම

II. මැදිහත් පිළිවෙත් අනුගමනය කිරීම,දේශනා කුසලතාවය,අගතිගාමීවීම

III. උපාය කුසලතාවයෙන් යුක්තවීම,අන්තගාමීවීම, මැදිහත් පිළිවෙත් අනුගමනය කිරීම

IV. මහා කරුණාවෙන් යුක්තවීම,පිරිසිඳු චරිතයෙන් යුක්තවීම,ආත්මාර්ථකාමී වීම

V. අගතිගාමීවීම,මැදිහත් පිළිවෙත් අනුගමනය කිරීම,උපාය කුසලතාවයෙන් යුක්ත වීම

29) බුදුරජාණන් වහන්සේ විසින් ධර්මදේශනා කිරීමේදී විවිධ ක්‍රම අනුගමනය කර ඇත. ඒ අතර උපමානුසාරී දේශනා ක්‍රමයට උදාහරණයකි.

I. දම්සක් පැවතුම් සූත්‍රය II. කන්දරක සූත්‍රය III. රාහුලෝවාද සූත්‍රය

IV. ව්‍යාග්ඝපජ්ජ සූත්‍රය V. කාලාම සූත්‍රය

30) අටලෝ දහමින් කම්පා නොවී සිටීමට,කෙලෙස්වලින් අනතුරුව සිටීම,අවෛරීව සිටීම යනාදී කරුණු වලින් පිළිඹිබුවන්නේ බුදුරජාණන් වහන්සේ සතුවූ

I. ආදර්ශවත් නායකත්වයයි II. ආගමික සහනසීලීත්වයයි III. පද්මාකාර ජීවිතයයි

IV. තාදී ගුණයයි V. නිදහස් චින්තනයයි

31) “ලෝකයේ සුප්‍රසිද්ධආගම්වලින් මා බුදු දහමට විශේෂයෙන් මුල් බුදුදහමට කැමතිවන්නේ එය කිසිවකු නොපෙළන බැවිනි” මෙම ප්‍රකාශය කරනු ලැබුවේ

I. මහාචාර්ය සොන්ඩර්ස් විසිනි II. මහාචාර්ය මැක්ට්‍රලර්ස් විසිනි III. මහාචාර්ය ලක්ෂ්මි නරසු විසිනි

IV. ඇල්බට් අයින්ස්ටයින් විසිනි V. බර්ට්‍රන් රසල් විසිනි

32) බුදුරජාණන් වහන්සේගේ ලෝකාර්ථ චර්යාවට නිබඳ ව සහය දුන් භික්ෂූන් වහන්සේ වන්නේ

I. මහා කාශ්‍යප විසිනි II. ආනන්ද හිමිය III. මුගලන් හිමිය

IV. උපාලිහිමිය V. සැරියුත් හිමිය

33) අස්සජි තෙරුන්වහන්සේ දේශනා කළ “යේ ධම්මා හේතුප්පබවා ....” යනාදී වශයෙන් ධර්මය ශ්‍රවණය කිරීමෙන් සෝවාන් ඵලයට පත් වූයේ

I. සංජය පිරිවැජියාය II. උපතිස්ස පිරිවැජියාය III. සෝණදණ්ඩ බමුණාය

IV. කෝලිත පිරිවැජියාය V. සකුළුදායි පිරිවැජියාය

34) බුදු රජාණන් වහන්සේගේ අවසරගෙන විශාලා මහනුවර භික්ෂුණී ආරාමයේදී ඍද්ධි ප්‍රාතිහාර්ය පා පිරිනිවන් පානා ලද්දේ

I. මහා ප්‍රජාපතිගෝතමී තෙරණියයි II. සිසු උපාචාලා තෙරණියයි III. ඛේමා තෙරණියයි

IV. උත්පලවන්නා තෙරණියයි V. යශෝදරා තෙරණියයි

35) මහා නිධාන සූත්‍රය ශ්‍රවනය කිරීමෙන් සෝවාන් ඵලයට පත් වූ භික්ෂුණීන් වහන්සේ වනුයේ

I. සකුලා තෙරණියයි II. චාලා තෙරණියයි III. ඛේමා තෙරණියයි

IV. උපචාලා තෙරණියයි V. පටාචාරා තෙරණියයි

36) අනතිමානිකම,නිර්ලෝභීත්වය,ශාසන ලැදියාව හා ඥාති හිතමිත්‍රාදීන් ආගම දහමට යොමු කරවීමට උත්සාහ ගැනීම ආදී ගුණාංගයන්ගෙන් යුක්ත වූ චරිතයක් වන්නේ

I. චිත්ත ගෘහපති උපාසකතුමාය    II. නකුල පිතාය    III. මහාධන සිටු තුමාය

IV. අපුත්තක සිටුතුමාය    V. අනාථපිණ්ඩික සිටුතුමාය

37) චිත්ත ගෘහපතිතුමාට ගැරහීම නිසා බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රථම වතාවට "පටිසාරණීය කර්මය" පනවන ලද්දේ

I. චන්න භික්ෂුවටය    II. සුධම්ම භික්ෂුවටය    III. සුභද්‍ර භික්ෂුවටය

IV. ධර්මාරාම භික්ෂුවටය    V. දේවදත්ත භික්ෂුවටය

38) භික්ෂු,භික්ෂුනීන් වහන්සේලාට වැසි සළු,ආගන්තුක බත, ගමුපත බත,ගිලන් බත ආදියෙන් උවටැන් කිරීම නිසා උභය සංඝයාගේ මාතාව බවට පත්වූයේ

I. ඛේමා බිසව    II. කිසාගෝතමීයයි    III. වේදේහිකා සිටු දියණියයි

IV. නකුල මාතාවයි    V. විශාඛා මහෝපාසිකාවයි

39) නකුල මාතාවට බුදු සසුනෙහි හිමිවූ අගතනතුර වන්නේ

I. ඇදහිය හැකි කථා ඇති උපාසිකාවන් අතර අග්‍රස්ථානයයි

II. දන්දීමේ ඇලුනු උවසුන් අතර අගතනතුරයි

III. ධර්මදානය හා අත්දැකීම් බහුල අය අතර අගතනතුරයි

IV. චිරජාත්‍රඥ භික්ෂුනීන් අතර අගතනතුරයි

V. සෘද්ධිමතුන් අතර අගතනතුරයි

40) බුදුරජාණන් වහන්සේ පුද්ගලයාගේ ස්වාධීනත්වය හා නිදහස් චින්තනය අගය කරමින් දේශනා කළ සූත්‍රය නම්

I. වීමංසක සූත්‍රයයි    II. කාලාම සූත්‍රයයි    III. සන්ධක සූත්‍රයයි

IV. කකචූපම සූත්‍රයයි    V. පත්තකම්ම සූත්‍රයයි

41) මිනිසාගේ ස්වාධීනත්වය මිනිසාට පවරා ගනිමින් බාහිර ගැලවුම්කරුවකු මත රඳා නොපවතින ලෙස කරනු ලබන ඉගැන්වීම

I. ඊශ්වර නිර්මාණවාදයයි    II. බ්‍රාහ්මණ නිර්මාණවාදයයි    III. පුබ්බේකත හේතුවාදයයි

IV. බෞද්ධ හේතුඵල වාදයයි    V. නියතිවාදයයි

42) බුද්ධ දේශනාවට අනුව පුද්ගල ශක්තිය අර්ථවත් කෙරෙන කරුණු පමණක් ඇතුළත් නොවන පිළිතුර තෝරන්න.

I. ආරම්භක ධාතු, නික්කම ධාතු, ලලාට ධාතු    II. ආරම්භක ධාතු, ථාම ධාතු, පරක්කම ධාතු

III. අන්තකාර ධාතු, උපක්කමධාතු, ආරම්භක ධාතු    IV. ආරම්භක ධාතු, පරක්කමධාතු, පරක්කම ධාතු

V. ථාම ධාතු, ධිති ධාතු, පරක්කම ධාතු

43) සමාජ ප්‍රභවය හා විකාශ පිළිබඳ බෞදධ ඉගැන්වීම් අග්ගඤ්ඤ සූත්‍රයේදී විග්‍රහකොට ඇත්තේ කුමන කරුණක් පදනම් කොට ගෙන ද?

I. පාරිසරික සාධක    II. ආර්ථික සාධක    III. ආචාර විද්‍යාත්මක සාධක

IV. පටිච්ච සමුප්පාද මූලධර්මය    V. මනෝවිද්‍යාත්මක සාධක

44) පටිච්චසමුප්පාදය මත පදනම්ව විග්‍රහකෙරෙන සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් මගින් බැහැරවන සංකල්පය වන්නේ

I. ඊශ්වරවාදී සංකල්පය    II. නිර්මාණවාදී සංකල්පය    III. සංශයවාදී සංකල්පය

IV. අහේතු අප්පච්චයවාදී සංකල්පය    V. උච්ඡේදවාදී සංකල්පය

45) අපු අනුන්ගේ ජීවිතවලට ගරු කරමින් අන් අයට අභයදානය දෙමින් අනුන්ගේ දේපල අයිතියට ගරු කරමින් ,අනුන්ගේ පවුල් ජීවිත සුරකිමින් ,පුද්ගලාන්තර විශ්වාසය සුරකින සාමය රැකගැනීමට කැපවෙන පුද්ගලයකු ක්‍රියා කිරීමට උපකාරිවන ප්‍රතිපදාව නම්

I. සතර අගති වරතියයි II. සතර සංග්‍රහ වස්තුයි III. සප්ත අපරිහානීය ධර්මයයි

IV. දස සක්විතිවත්ය V. පංචශීල ප්‍රතිපදාවයි

46) බෞද්ධ ජාතක කථා සාහිත්‍යයෙහි දැහැමින් රට පාලනය කරන රජකු විසින් අනුගමනය කළ යුතු පිළිවෙත් 10 හඳුන්වන්නේ

I. දසරාජ ධර්මයයි II. දස සක්විතිවත්ය III. දස පුණ්‍ය ක්‍රියාය

IV. දස පාරමිතාය V. දස පින්කිරියවත්ය

47) බෞද්ධ දේශපාලන මූලධර්මයන්ට අනුව සමාජයේ දුගීභාවය දුරුකිරීමට අවශ්‍ය පියවර ගැනීමත්,අපරාධ මරිධනය කොට සමාජය තුළ සාමය පවත්වා ගෙන යාමටත්,පූජනීය විශාරදයින් ගේ අවවාද අනුශාසනා ලබාගැනීම යනාදී කරුණු ඇතුළත්,සංකල්පයකි

I. දසරාජ ධර්මය II. දසසක්විතිවත් III. ලෝක පාලන ධර්ම

IV. සප්ත අපරිහානීය ධර්ම V. පංචශීල ප්‍රතිපදාව

48) පුද්ගලයාගේ ස්වාධීනත්වය,ස්වච්ඡන්දතාව වගකීම ප්‍රකට කෙරෙන වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ

I. තමා උපමාකොට අනුන්ට හිංසා පීඩා නොකල යුතුය යන්නයි

II. පව් කරන්නා දෙලොවම තැවෙයි යන්නි

III. සරු දේ සරු ලෙසත් ,නිසරු දේ නිසරු ලෙසත් දැක්යි යුතුය යන්නයි

IV. චේතනාව කර්මය වේ යන්නයි

V. තමා පිහිට තමාමය, අන්කිසි පිහිටක් නැත යන්නයි

49) “මහා පරිනිබ්බාන සූත්‍රයට අනුව ජන සම්මතවාදී පාලනයක සාම්ප්‍රදායික මූල ධර්ම රැක ගනිමින් පාලන කටයුතු සිදු කිරීම තුළින් එකී පාලන තන්ත්‍රය පහසුවෙන් බිඳ වැටෙන්නේය” යන්න දේශපාලනය සම්බන්ධ බෞද්ධ ඉගැන්වීම්වල දැක්වේ ?

I. පංචශීලය ප්‍රතිපදාව II. දසරාජ ධර්මය තුළය III. සප්ත අපරිහානීය ධර්මය තුළය

IV. දස සක්විතිවත් තුළය V. සතර සංග්‍රහ වස්තු තුළය

50) මව් පිය දෙපසින් අභිජාත පිළිගත් තැනැත්තෙකු වීම,ධන ධාන්‍ය ඉසුරුමත් පුද්ගලයෙකුවීම, සිල්වත් වීම යනාදී සුදුසුකම් පාලකයෙකු සතු විය යුතු යැයි සඳහන් සූත්‍රය වනුයේ

I. චක්කවත්තිසීහනාදය II. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය III. මංගල සූත්‍රය

IV. කූටදත්ත සූත්‍රය V. පත්තකම්ම සූත්‍රය

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விம் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விம் வலயம

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2020 මාර්තු

| බෞද්ධ ශිෂ්ටාචාරය II | 12 ශ්‍රේණිය | කාලය : පැය 03 යි |
|---|---|---|

සැලකිය යුතුයි

- 1 කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න 3 ක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

### I කොටස

(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් පමණක් තෝරාගෙන පිළිතුරු සපයන්න)

01) I. වෛශ්‍ය වර්ණයට අයත් ස්ව ධර්ම ගෙනහැර දක්වන්න.

II. ක්ෂත්‍රිය වර්ණයට අයත් ආපත් ධර්ම නම් කරන්න.

III.“බාල්‍යෙය පිතුර්වශෙ ත්ෂ්ඨේත් ..........” යන ශ්ලෝකය සම්පූර්ණ කර ලියන්න.

IV. ක්‍රි.පූ.6 වන සියවස වන විට භාරතයේ පැවති ශ්‍රමණ ගුරු කුළ 4 ක් නම් කරන්න.

V. මක්ඛලී ගෝසාල ශාස්තෘවරයාගේ දර්ශනය ගෙනහැර දක්වන්න.

02) I. සාමඤ්ඤඵල සූත්‍රයේ දැක්වෙන ආකාරයට පූර්ණ කස්සප ශාස්තෘවරයා අකිරියවාදියෙකු වන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

II. සොළොස් මහ ජනපද නම් කරන්න.

III. රාජාණ්ඩු ක්‍රමයේ මූලික ලක්ෂණ 4 ක් ගෙනහැර දක්වන්න.

IV. ක්‍රි.පූ.6 වන සියවසේ භාරතීය සමාජය ධනෝපායනයේදී ප්‍රධාන මාධ්‍ය ලෙස භාවිත කළ රැකියා කිහිපයක් නම් කරන්න.

V. අරහං බුදු ගුණය කෙටියෙන් ගෙනහැර දක්වන්න.

03) I. විශිෂ්ට ශාස්තෘත්වය බුද්ධ චරිතයෙන් ඔපවත් වන අවස්ථා 2 ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

II. බුදු රජාණන් වහන්සේ ශ්‍රාවකයින් විසින් නගන ලද ප්‍රශ්නවලට පිළිතුරු සැපයූ ක්‍රම 4 නම් කරන්න.

III. ආනන්ද හිමියන් විසින් බුදුරජාණන් වහන්සේ ගෙන් ඉල්ලා සිටි ආයාචනා වර 4 නම් කරන්න.

IV. මහා ප්‍රජාපතී ගෝතමී රහත් තෙරණියගේ චරිතයෙන් ගතහැකි ආදර්ශ 4ක් දක්වන්න.

V. විශාඛා කුමරිය පතිකුලයට පිවිසෙන විට දී පියාණන් විසින් ලබාදුන් අවවාද 4 ක් නම් කරන්න.

### II කොටස

(මෙම කොටසින් ප්‍රශ්න තුනක් පමණක් තෝරාගෙන පිළිතුරු සපයන්න)

04) I. පුද්ගල ස්වාමිත්වය අගය කර ඇති ආකාරය බෞද්ධ සූත්‍ර ධර්මය ඇසුරින් පෙන්වා දෙන්න.

II. පුද්ගලයාගේ ස්වාධීනත්වය හා ස්වච්ඡන්දතාව බුදුරජාණන් වහන්සේ අගය කළ ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

05) I. සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම අග්ගඤ්ඤ සූත්‍රය ඇසුරින් පැහැදිලි කරන්න.

II. බුදු සමය සමාජ සංස්ථාවන්හි ප්‍රභවය පරිණාමය හා විකාශය හේතු ප්‍රත්‍යාකාරව විග්‍රහ කර ඇත. විමසුමට ලක් කරන්න.

06) I. සමාජ සම්භවය පිළිබඳ විවිධ මතවාද බෞද්ධ දර්ශනයෙන් නිෂේධනය වන ආකාරය පැහැදිලි කරන්න.

II. බෞද්ධ රාජ්‍යත්වය ප්‍රජාතන්ත්‍රීය හා ජනහිතකාමී ලක්ෂණ වලින් යුක්ත වූ ආකාරය විස්තර කරන්න.

07) I. යහපත් පාලන තන්ත්‍රයක් ගොඩනගා ගැනීමෙහිලා බෞද්ධ දේශපාලන මූලධර්ම ඇසුරින් ලබාගත හැකි ආදර්ශ විස්තර කරන්න.

II. සමාජයක උද්ගතවන ගැටළු අවම කරගැනීම උදෙසා පංචසීල ප්‍රතිපදාවෙන් ලැබිය හැකි පිටිවහල පැහැදිලි කරන්න.

08) I. දැහැමින් රට පාලනය කරන රජ කෙනෙකුට අනුගමනය කළ හැකි පිළිවෙත් දස රාජධර්ම ඇසුරින් විමසුමට ලක් කරන්න.

II. යහපත් රාජ්‍ය පාලනයට බෞද්ධ දේශපාලන මූලධර්ම උපයෝගී වන ආකාරය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.